10 ශ්‍රේණිය

නිපුණතාව 2.0

**ස්වකීය පකරිල්පන මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**2.7.2 රචනා කරන ලද පෙළ රංග ශිල්ප භාවිත කොට රංගයක් බවට පත් කිරීම.**

විවිධ නාට්‍යවල දෘෂ්‍යපට කිහිපයක් සිසුන්ට පෙන්වීම හා ඒ පිළිබඳ සාකච්ඡාවක් ගොඩනැගීම. හරි දැන් අපි කලින් දවසක ලියපු පිටපත්වලින් හොඳම එක තෝරගමු. ඊට කලින් කියන්න ඕනේ, කොයි පිටපත තේරුණත් අපේ පන්තියේ ඉන්න අය තමයි රඟපාන්න ඕනේ. අනුෂංගික නිර්මාණය කරන්න ඕනේ. අපි ඒ නාට්‍යය සිකුරාදා උදේ රැස්වීමක පෙන්නන්න සැලසුම් කරමු.

පිටපත නාට්‍යයක් කරන්න අපි මොනවද කරන්න ඕනේ. නළු නිළියන් තෝරගන්න ඕනේ, පුහුණුව, අනුෂංගික සැලසුම් කරන්න ඕනේ, ඒ වෙනුවෙන් මම ඔයාලාව තෝරනවා. දැන් බලමු හොඳ ම පිටපත. (තෝරා ගනියි)

දක්ෂතා අනුව, චරිතයේ ස්වභාවයට අනුව පෙනුම, කටහඬ, මේ වගේ දේවල් අනුව නළු නිළියන් තොරා ගනිනවා.

හරි අපි නාට්‍යයට නළු නිළියන් තේරුවා. ඉතිරි අය කණ්ඩායම් විදියට අනුශංගික නිර්මානය කරන්න බෙදමු. මේව කරන්නත් විශේෂ දක්ෂකමක් තියෙන්න ඕනේ. මෙතන ඇති හොඳ ඩිසයිනර්ස්ලා. මේ වැඩේදි අපි බලමු.

දැන් විශේෂම කාර්යයක් තියෙනවා. ඒ තමයි වේදිකා පරිපාලකයෙක් තෝරගන්න එක. දෙන්නෙක් වුනත් කමක් නෑ. හරි. ඔය දෙන්නට තමයි රිහසල් ප්ලෑන් කරන්න තියෙන්නේ. අපිට ලොකු දවසක් නෑ. අපි දවස් කීපයක් ආෆ්ටර් ස්කූල් රිහසල් දාගමු. ඩිසයින් කරන අයට මම උදව් කරන්නම්. හරි, අපි ඉක්මනට ම වැඩ පටන්ගමු. නාට්‍යය පෙන්නල ඒ ගැන ආයෙම කතා කරමු.